සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2017

## 10 ශ්‍රේණිය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - I පත්‍රය

නම/විභාග අංකය :- ...................................................... කාලය : පැය 01 යි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවල (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගන්න.

(1) ව්‍යවසායකත්වය යන්නට නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(i) අනාගතය වෙනස් කිරීමට යොමුවන්නා වූ පුද්ගලයින්ගේ මානසික තත්ත්වයකි.
(ii) පුද්ගලයින්ගේ ධනාත්මක ආකල්ප, හැසිරීම හා කුසලතා පිළිබඳ එකතුවකි.
(iii) ව්‍යාපාරික කටයුතු හා ලාභය සමග පමණක් බැඳුණු සංකල්පයකි.
(iv) සිතන, තර්ක කරන හා ක්‍රියා කරන ආකාරයකි.

(2) ව්‍යවසායකත්වය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වනුයේ,
(i) ලාභය උපරිම කර ගැනීමට පමණක් කටයුතු කිරීම.
(ii) පවතින දේ පිළිබඳව විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට කටයුතු කිරීම.
(iii) අවදානම් භාර ගැනීමට කැමැත්තක් නොදැක්වීම.
(iv) සාම්ප්‍රදායික අදහස් හා සංකල්ප එලෙසම ක්‍රියාත්මක කිරීම.

(3) ව්‍යවසායකයා නැමැත්තා සිතනුයේ,
(i) කර්මය පිළිබඳව ය. (ii) වාසනාව පිළිබඳව ය.
(iii) අන් අයගේ අදහස් පිළිබඳව ය. (iv) නව අදහස් පිළිබඳව ය.

(4) නව අදහස් මතම තීරණවලට එළැඹෙන ව්‍යවසායකයා අන්‍ය අදහස් ගරු කරයි. ව්‍යවසායකත්වයේ දී මෙම ලක්ෂණය හැඳින්වෙන්නේ,
(i) පිළිගැනීම ලක්ෂණය. (ii) වගකීම ලක්ෂණය.
(iii) ස්වාධීනත්වය ලක්ෂණය. (iv) සහයෝගය ලක්ෂණය.

(5) ව්‍යවසායකත්වයේ භූමිකා දැක්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,
(i) නවප්‍රවර්තකරු, නායකයා, කළමනාකරු (ii) අයිතිකරු, කළමනාකරු, නිෂ්පාදකයා
(iii) අයිතිකරු, කළමනාකරු, නායකයා (iv) පාරිභෝගිකයා, කළමනාකරු, නායකයා

(6) ව්‍යවසායකත්වයේදී "අවදානම" යන්නෙන් අදහස් කරන්නේ,
(i) ව්‍යාපාර අදහසක ප්‍රතිඵල නිශ්චිත බවයි. (ii) ව්‍යාපාර අදහසක ක්‍රියාත්මක කිරීම පහසු බවයි.
(iii) ව්‍යාපාර අදහස සාර්ථක හෝ අසාර්ථක වීමයි. (iv) ව්‍යාපාර අදහස අසාර්ථක වීමයි.

(7) ව්‍යවසායකයා පරිසර වෙනස්කම්වලට අනුගත විය යුතුය. එනම්,
(i) තරඟකිරීමයි. (ii) සහයෝගයෙන් වැඩ කිරීමයි.
(iii) නම්‍යශීලීත්වයයි. (iv) තනිව වැඩ කිරීමයි.

(8) ව්‍යවසායකයකුට ව්‍යවසායකත්වය තුළින් ලැබෙන ප්‍රතිලාභයකි.
(i) නව නිෂ්පාදන හා සේවා වෙළඳපොළට ඉදිරිපත් කිරීම.
(ii) අනුකරණයක් වෙළඳපොළට ඉදිරිපත් කළ හැකි වීම.
(iii) නිදහසේ වෙළඳපොළට පිවිසිය හැකිවීම.
(iv) කාලයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම.

(9) අවදානම හා ප්‍රතිලාභය අතර පවත්නා සම්බන්ධය මින් කිනම් ප්‍රකාශයෙන් දැක්වේද?
(i) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.
(ii) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය පහළ වේ.
(iii) අවදානම පහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.
(iv) අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධයක් නැත.

(10) මින් අවශ්‍යතා පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(i) ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස
(ii) ආහාර, බත්, නිවාස
(iii) ආහාර, ඇඳුම් පැළඳුම්, තට්ටු නිවාස
(iv) ආහාර, යෝගට්, නිවාස

(11) මිනිස් අවශ්‍යතා සපුරාලන සේවාවක ලක්ෂණයක් වන්නේ.
(i) ස්පර්ශ වීම.
(ii) සමජාතීය බව අපේක්ෂා කළ හැකිවීම.
(iii) ගබඩා කළ හැකිවීම.
(iv) සපයන්නාගෙන් වෙන් කළ නොහැකිවීම.

(12) ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් නොවන්නේ.
(i) නිර්මාණශීලීත්වය
(ii) නවෝත්පාදනය
(iii) අවදානම භාර ගැනීම.
(iv) පමාශීලීත්වයක් නොදැක්වීම.

(13) පහත වාක්‍ය අතුරින් වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.
(i) මහා පරිමාණ ව්‍යාපාර බොහොමයක ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වේ.
(ii) සෑම ව්‍යාපාරිකයකුම ව්‍යවසායකයකු වේ.
(iii) දැනටමත් පාරිභෝගික අවශ්‍යතා ඉටුකර ඇති කොටස වෙළඳපොළ හිඩැස වේ.
(iv) ව්‍යවසායකයකු හා ව්‍යාපාරිකයකු අවදානමට මුහුණ දෙයි.

(14) ව්‍යවසායකයකු ඉටු කරන අයිතිකරුගේ භූමිකාවට අදාළ කාර්යයකි.
(i) සේවකයින් මෙහෙයවීම.
(ii) ව්‍යාපාර සැලසුම් සැකසීම.
(iii) ලාභ හෝ පාඩු විඳ දරා ගැනීම.
(iv) ව්‍යාපාරයේ තත්ත්වය ඇගයීමට ලක් කිරීම.

(15) ව්‍යාපාරයක් සකස් කරනු ලබන සැලැස්මට අනුව ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කර බැලීම.
(i) පාලකයා ලෙස වූ භූමිකාවයි.
(ii) අයිතිකරු ලෙස වූ භූමිකාවයි.
(iii) කළමනාකරු ලෙස වූ භූමිකාවයි.
(iv) ව්‍යාපාරිකයා ලෙස වූ භූමිකාවයි.

(16) කුඩා පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණයක් නොවන්නේ.
(i) පෞද්ගලික හිමිකාරිත්වය.
(ii) සාපේක්ෂව අඩු ආයෝජනයක් තිබීම.
(iii) කුඩා සේවක සංඛ්‍යාවක් සිටීම.
(iv) ව්‍යාපාර කටයුතු විශාල ප්‍රදේශයක පැතිර තිබීම.

(17) ව්‍යාපාර ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කරන අභ්‍යන්තර පරිසර සාධකයකි.
(i) ප්‍රජා පරිසරය.
(ii) සමාජ හා සංස්කෘතික පරිසරය.
(iii) සේවකයෝ.
(iv) තාක්ෂණික පරිසරය.

(18) පහත ප්‍රකාශවලින් ව්‍යාපාර ශක්තියක් වන්නේ.
(i) කුසලතා සහිත කළමනාකරුවන් ව්‍යාපාරයට බැඳවා ගැනීම.
(ii) නියමිත වේලාවට පසු සේවකයන් සේවාස්ථානයට පැමිණීම.
(iii) ව්‍යාපාර පරිශ්‍රයේ අක්‍රමවත් බව.
(iv) ඉහළ පොලී ප්‍රතිශතයකට ණය මුදල් ලබා ගැනීම.

(19) ළමා ජනගහනය වැඩිවීම සෙල්ලම් බඩු නිෂ්පාදකයන්ට හොඳ අවස්ථාවකි. මෙම ප්‍රකාශය,
(i) තර්ජනයකි.
(ii) ශක්තියකි.
(iii) අවස්ථාවකි.
(iv) දුර්වලතාවයකි.

(20) පහත ක්‍රියාකාරකම්වලින් ව්‍යවසායකයකුගේ තාක්ෂණික කුසලතා ගණයට අයත් වන්නේ කුමක්ද?
(i) විධිමත් ක්‍රමවේදයට අනුව සේවකයකු බඳවා ගැනීම.
(ii) ව්‍යාපාරයේ පුද්ගල කණ්ඩායම් සමග වැඩ කිරීමේදී අදහස් හුවමාරු කර ගැනීම.
(iii) නව වෙළඳපොළ සොයා ගැනීමට ඇති හැකියාව.
(iv) කණ්ඩායම් ලෙස වැඩ කිරීමට ඇති හැකියාව.

(ලකුණු 2 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2017

### 10 ශ්‍රේණිය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - II පත්‍රය

නම/විභාග අංකය :- ..................................................... කාලය : පැය 02 යි.

❖ පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) අ.පො.ස. (උ.පෙළ) වාණිජ අංශයෙන් විභාගයට පෙනී සිටි සමන්සිරිට විශ්ව විද්‍යාලයට යාමේ අවස්ථාව හිමි නොවීය. එම නිසා දෙමාපියන්ට බරක් නොවී තම වියදමට සහ බාල සහෝදරයන්ට අධ්‍යාපනය සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමේ අරමුණින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සමන්සිරි අදහස් කළේ ය. ප්‍රදේශයේ ජීවත්වන ජනතාව දිනපතාම බේකරි නිෂ්පාදන නගරයේ වෙළෙඳසැල් වලින් මිලදී ගන්නා බව අධ්‍යයනය කළ සමන්සිරි, පියාගෙන් ලබාගත් රු.100000/- මුදලක් යොදා කුඩාවට බේකරියක් ආරම්භ කළේය. මේ සඳහා බේකරි නිෂ්පාදන සැදීම පිළිබඳව පුහුණුවක් තිබූ පුද්ගලයෙක් මසකට රු. 10000ක වැටුපකට සේවයට බැඳවා ගන්නා ලදී. ඔහු වසර 10ක පමණ කාලයක් නගරයේ බේකරියක වැඩ කළ අයෙකි.

පාන්, කේක්, බනිස් ඇතුළු විවිධ බේකරි නිෂ්පාදන ඉතා පිරිසිදුව අලෙවියට තැබීමටත්, නිෂ්පාදන මිලදී ගැනීමට පැමිණෙන අය සමඟ මිත්‍රශීලීව ගනුදෙනු කිරීමටත් සමන්සිරි කටයුතු කළේ ය. මේ නිසා ඉතා ටික කාලෙකින් සමන්සිරි ගේ ව්‍යාපාරය දියුණුවට පත්විය.

ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බේකරියේ සේවය සඳහා තවත් සේවකයින් 4 ක් බඳවා ගන්නා ලදී. ලංකා බැංකුවෙන් රු. 1,000,000/- ක ණය මුදලක් ලබා ගෙන වෑන් රථ 2ක් යොදවා බේකරි නිෂ්පාදන අවට ගම්මාන වලටත් බෙදාහැරීමට කටයුතු කළේ ය. කෙටි කලකින් තම අරමුණු ඉටුකර ගත් සමන්සිරි ප්‍රදේශයේ පිළිගැනීමක් සහිත නායකත්වයක් හිමි පුද්ගලයෙක් බවට පත්විය.

ඉහත සිද්ධිය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) මෙම සිද්ධියේ දැක්වෙන පරිදි සමන්සිරි ව්‍යාපාරය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?
(ii) සමන්සිරි තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව ලක්ෂණ 2ක් ලියන්න.
(iii) මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදන මිලදී ගැනීමෙන් සපුරා ගන්නා මූලික අවශ්‍යතාව කුමක්ද?
(iv) ඉහත සඳහන් අවශ්‍යතාව සපුරාගත හැකි අයිතම 2ක් නම් කරන්න.
(v) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 2ක් ලියන්න.
(vi) සමන්සිරිගේ ව්‍යාපාරය ඇසුරින් ව්‍යාපාරවලට අදාළ ගති ලක්ෂණ 2ක් ලියන්න.
(vii) ව්‍යවසායන වර්ග කිරීම අනුව සමන්සිරිගේ ව්‍යාපාරය කුමන වර්ගයට අයත් වේද?
(viii) ඉහත සඳහන් සිද්ධියට අනුව සමන්සිරි ව්‍යවසායකයෙක් ලෙස නැගී සිටීමට යොදා ගත හැකි කරුණු 2ක් ලියන්න.
(ix) ව්‍යාපාරවල පරිමාණය අනුව වර්ග කිරීමේදී සමන්සිරිගේ ව්‍යාපාරය කුමන වර්ගයට අයත්වේද?
(x) සමන්සිරිගේ ව්‍යාපාරය ආශ්‍රිතව දැකිය හැකි ශක්තීන් 2ක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

(2) (i) "ව්‍යවසායකයා" යන්න නිර්වචනය කරන්න.
(ii) ව්‍යවසායකත්ව මූලික ගති ලක්ෂණ 4ක් ලියන්න.
(iii) ව්‍යවසායකයන් තුළ පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණ 2ක් ලියන්න.
(iv) ව්‍යවසායකයා හැම විටම අවදානම හා ප්‍රතිලාභය පිළිබඳ සැලකිල්ලක් දක්වයි. එම අවදානම හා ප්‍රතිලාභය අතර ඇති සම්බන්ධය දක්වන්න.
(v) ව්‍යවසායකයන් සඳහා ණය පහසුකම් සපයන වාණිජ බැංකු 2ක් නම් කරන්න. (ලකුණු 2 x 5 = 10)

(3) (i) නිෂ්පාදන සාධක නම් කරන්න.
(ii) නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක 2ක් ලියන්න.
(iii) නවෝත්පාදන සිදුවන ආකාර 2ක් ලියන්න.
(iv) නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.
(v) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර 2ක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

(4) (i) ව්‍යවසායකත්වයෙන් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ 2ක් ලියන්න.

(ii) ව්‍යවසායකයාට සමාජීය සුබ සාධනය සඳහා දායක විය හැක. සමාජීය සුබ සාධනය සඳහා දායක විය හැකි ආකාර 2ක් සඳහන් කරන්න.

(iii) "රටක සංවර්ධනයට ව්‍යවසායකත්වය හැකිවම වැදියි" ඒ අනුව රටක සංවර්ධනයට ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ 2ක් ලියන්න.

(iv) ව්‍යාපාරයක් අතිශයින් සාර්ථක වූ විට ව්‍යවසායකයාට සමාජීය වශයෙන් විවිධ ප්‍රතිලාභ හිමිවීම නිරායාසයෙන් සිදුවේ. මෙසේ සමාජීය වශයෙන් හිමිවන ප්‍රතිලාභ 2ක් ලියන්න.

(v) ව්‍යවසායකයාට ව්‍යාපාර කටයුතු කිරීමේ දී විවිධ භූමිකා මත කටයුතු කිරීමට සිදුවේ. මෙම භූමිකා අවස්ථාවන් 2ක් සඳහන් කරන්න. (ලකුණු 2 x 5 = 10)

(5) (i) ව්‍යාපාරවල ප්‍රමාණය අනුව ව්‍යාපාර වර්ග 3කට බෙදේ. ඒවායින් 2ක් නම් කරන්න.

(ii) කුඩා පරිමාණ ව්‍යාපාරවලට අදාළව හඳුනාගත හැකි ලක්ෂණ 4ක් ලියන්න.

(iii) "ආර්ථික සංවර්ධනයට කුඩා පරිමාණ ව්‍යාපාරවලින් ලැබෙන දායකත්වය අති විශාලය" මෙය සනාථ කිරීමට කරුණු 2ක් ලියා දක්වන්න.

(iv) ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා "ශක්ති" වැදගත් වේ. "ශක්ති" යනුවෙන් කුමක් අදහස් වේද?

(v) කුඩා පරිමාණ ව්‍යාපාරයක ඇතිය හැකි ශක්තීන් 2ක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

(6) (i) ව්‍යවසායකයකු වර්ධනය කරගත යුතු මූලික කුසලතා රාශියකි. ඒවායින් 2ක් සඳහන් කරන්න.

(ii) සෑම රටක ආර්ථිකය තුළ කුඩා පරිමාණ ව්‍යාපාර බහුලව දක්නට ලැබේ. නමුත් මෙම ව්‍යාපාර ආරම්භ කොට පවත්වාගෙන යාමේදී එහි සාර්ථකත්වයට බාධා පමුණුවන සාධක රාශියක් ඇත. ඒවායින් 2ක් නම් කරන්න.

(iii) කුඩා පරිමාණ ව්‍යාපාර බොහෝ විට අසාර්ථක වේ. මේ සඳහා බලපාන හේතු 2ක් ලියන්න.

(iv) "කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග හැතුවා නොවේ." මේ සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

(v) අභිනිසරු කළමනාකරණ භූමිකාව තුළ කළ යුතු කාර්යයන් 2ක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)